Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න.
http://iscolee.blogspot.com/

**දෙවන වාර පරීක්ෂණය - 2018** | **8 ශ්‍රේණිය**

**இரண்டாந்தவணைப் பரீட்சை - 2018** | **தரம் 8**

**Second Term Test - 2018** | **Grade 8**

**ගණිතය I , II** | **පැය දෙකයි**

**Mathematics I , II** | **Two hours**

**I කොටස- සියළුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

නම ඃ ..............................................................................


1. (+2)+(+5) අගය සොයන්න.

2. 8.4 cm දිග කම්බියක් සමාන කොටස් 4 ක ට කැපූවිට එක් කොටසක දිග කොපමණ ද ?

3. $4x + 8 = ....... (\ x + ....\ )$ සාධක දනුම භාවිතයෙන් හිස්තැන් සම්පූර්ණ කරන්න.

4. සමපාද ත්‍රිකෝණයක පාදයක දිග 12 cm කි. එහි පරිමිතියට සමාන පරිමිතියක් සහිත සමචතුරස්‍රයක පැත්තක දිග සොයන්න.


5. රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් $x$හි අගය සොයන්න.




6. අෂ්ඨතලයක ඇති ශීර්ෂ ගණන කීය ද ?

7. $\frac{3}{4} \times \frac{4}{5}$ සුළු කරන්න.

8. රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් $x$ හි අගය සොයන්න.





9. ග්‍රිනිච් හි වේලාව පෙ.ව. 10.30 වන විට යම් රටක වේලාව පෙ.ව. 9.00 වේ . එම රට පිහිටි කාල කලාපය කුමක් ද ?

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

10. සමචතුරස්‍රයක භ්‍රමක සමමිති ගණය කීය ද ?

11. යම් සංඛ්‍යා රටාවක පොදු පදය 3n-2 වේ . මෙහි මුල් පද දෙක සොයන්න.

12. දී ඇති ABC ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.





13. ත්‍රිකෝණයක එක් කෝණයක් $110^0$ කි . කෝණ අනුව ත්‍රිකෝණ වර්ගීකරණයේ දී මෙම ත්‍රිකෝණය හඳුන්වන නම කුමක් ද ?

14. ග්‍රිනිච් නගරයේ වේලාව 14:00 වන විට ( $+5\frac{1}{2}$ ) කාල කලාපයේ පිහිටි ශ්‍රී ලංකාවේ වේලාව කීය ද ?


15. $x : 10 = 8 : 5$ නම් $x$ හි අගය සොයන්න.

16. $a$ රූපය , $b$ රූපයේ පාට කළ කොටස මෙන් කී ගුණයක් ද ?




17. 45% භාගයක් ලෙස සරලම ආකාරයෙන් දක්වන්න.

18. $x$ හි අගය හේතු දක්වමින් සොයන්න.




19. 12pq හා 18p හි මහාම පොදු සාධකය සොයන්න.

20. මා ලඟ හා මල්ලී ලඟ ඇති මුදල් අතර අනුපාතය 3 : 5 වේ . මා ලඟ ඇති මුදල රු 120 නම් මල්ලී ලඟ ඇති මුදල සොයන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## ii කොටස

**ප්‍රශ්න 5 ක ට පමණක් උත්තර සපයන්න.**

---

1. a. i. 324 ප්‍රථමක සාධක වල ගුණිතයක් ලෙස ලියා දක්වන්න.

ii. ඔබේ උත්තර පත්‍රයට පිටපත් කරගෙන හිස් තැන් සම්පූර්ණ කරන්න.

$196 = 2 \times 2 \times 7 \times 7$

$196 = (2 \times 7) \times (\ldots\ldots \times \ldots.)$

$196 = (\ldots\ldots \times \ldots.)^2$


$\sqrt{196} = \ldots\ldots\ldots\ldots$

b. +4 කාල කලාපයේ පිහිටි ඩුබායි නගරයෙන් 14:00 ට ගමන් ආරම්භ කළ ගුවන් යානයක් +8 කාල කලාපයේ පිහිටි මැනිලා නගරයට ළඟාවන මොහොතේ එහි වේලාව 21:00 වේ.

i. ගුවන් යානය ඩුබායි නගරයෙන් පිටත් වූ මොහොතේ මැනිලා නගරයේ වේලාව කුමක් ද ?

ii. ගුවන් ගමනට ගතවූ කාලය කොපමණ ද ?

c. රූපයේ දක්වා ඇති ඝනකාභයේ පෘෂ්ඨ වර්ගඵලය සොයන්න.





---

2. i. දී ඇති රූප සටහනට අනුව ABC ත්‍රිකෝණයේ $x$ කෝණයේ අගය සොයන්න.

ii. හේතු දක්වමින් $x$ ඇසුරින් $y$ හි අගය ලියා දක්වන්න.

iii. සමපාද ත්‍රිකෝණයක් ඇඳ, එය PQR ලෙස නම් කරන්න. එහි සමමිතික අක්ෂ ලකුණු කර දක්වන්න.

iv. ඉහත PQR ත්‍රිකෝණයේ භ්‍රමක සමමිති ගණය කීය ද ?




---

3. a. i. $(-2)^5$ හි අගය සොයන්න.

ii. $42, x, y, 27, 22, \ldots$ රටාව අනුව මෙහි $x$ හා $y$ ගැලපෙන සංඛ්‍යා සොයන්න.

iii. $4n - 1$ පොදු පදය වන සංඛ්‍යා රටාවේ ,

(අ) මුල් පද දෙක සොයන්න.

(ආ) අගය 33 වන පදයක් මෙම සංඛ්‍යා රටාවේ තිබේ ද ? හේතු දක්වන්න.

b. i. නිමල් ජනවාරි මස පළමු දින සිට , කිසියම් මුදලක් බැගින් කැටයකට එකතු කරයි. ඔහු 1 වැනි දින රුපියලක් ද , 2 වැනි දින රු 4 ක් ද, 3 වැනි දින රු 9 ක් ද කැටයට දැමුවේ නම්, රටාවට අනුව 8 වැනි දිනයේ කැටයට දමන මුදල කොපමණ ද ?

ii. ඔහු , මුල් දින 6 තුල කැටයට දැමූ මුදල් ප්‍රමාණ පිළිවෙලින් ලියා දක්වන්න. ඒ තුළින් ඔබ දකින සංඛ්‍යා රටවේ පොදු පදය සොයන්න.

---

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

---

4. i. $1.2 \times 0.5$ අගය සොයන්න.
   ii. සෘජුකෝණාස්‍රාකාර ඉඩමක වර්ගඵලය $110.4\ m^2$වේ. එහි පළල $6\ m$ නම් දිග ගණනය කරන්න.
   iii. සමපාද ත්‍රිකෝණයක පරිමිතිය $36\ cm$ කි. එම පරිමිතියම ඇති සමචතුරස්‍රයක පැත්තක දිග $8cm$ වේ යැයි අමල් පවසයි. මෙම ප්‍රකාශය සත්‍ය වේ ද ? හේතු දක්වන්න.
   iv. පරිමිතිය $36\ cm$ වන , සෘජුකෝණාස්‍රයක දිග හා පළල විය හැකි පූර්ණ සංඛ්‍යාත්මක අගයන් දෙකක් ලියන්න.
   v. පළල $x$ ද, දිග $7\ cm$ ද වන සෘජුකෝණාස්‍රයක පරිමිතිය දැක්වීම සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න.

---

5. i. $3\frac{3}{4} \times \frac{4}{5}$ සුළු කරන්න.

   ii. $\frac{10}{21} \div 1\frac{3}{7}$ සුළු කරන්න.

   iii. $12\ m$ දිග කම්බියකින් $1\frac{1}{2}\ m$ බැගින් දිග කම්බි කැබලි කීයක් කැපිය හැකි ද ?

   iv. එක්තරා ගමක විසූ මිනිසුන් සංඛ්‍යාව 250 කි. එහි පිරිමි සංඛ්‍යාව හා කාන්තාවන් සංඛ්‍යාව අතර අනුපාතය $3 : 2$ ක් නම් ,
   (අ) පිරිමි සංඛ්‍යාව මුළු ජනගහනයේ භාගයක් ලෙස ලියන්න.
   (ආ) ගමේ විසූ පිරිමි ගණන කීය ද ?

---

6. *a.* i. $0.68$ භාගයක් ලෙස ලියා එය සරලම ආකාරයෙන් දක්වන්න.

   b. i. මෙම සෘජුකෝණාස්‍රයේ දිග හා පළල අතර අනුපාතය $3 : 1$ වේ.
   පළල $x$ ලෙස ගෙන එහි පරිමිතිය සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න.



   ii. සෘජුකෝණාස්‍රයේ පරිමිතිය $32\ cm$ නම් ඒ ඇසුරින් $x$ හි අගය සොයන්න.
   සෘජුකෝණාස්‍රයේ දිග කොපමණ ද ?
   iii. ඉහත සෘජුකෝණාස්‍රයේ පළල පමණක් දෙගුණ කළේ නම් ලැබෙන නව සෘජුකෝණස්‍රයේ දිග හා පළල අතර අනුපාතය සොයා සරලම ආකාරයෙන් දක්වන්න.

---

7. i. දී ඇති සංකේත අතුරින් එක් එක් හිස්තැනට සුදුසු සංකේතය තෝරා යොදන්න.
   ( $\in$ , $\notin$ )
   (අ) 9 ……….. {ප්‍රථමක සංඛ්‍යා }

   (ආ) ගාල්ල ..........{ සබරගමුව පළාතේ දිස්ත්‍රික්ක }

   (ඇ) 12 ……..{ 4 හි ගුණාකාර }

   ii. A යනු 1 ත් 20 අතර 7 හි ගුණාකාර ද, B යනු 1 ත් 20 ත් අතර ඇති ඔත්තේ සංඛ්‍යා ද නම්,
   (අ) A කුලකය සහ B කුලකය අවයව සහිතව ලියා දක්වන්න.
   (ආ) ඉහත ලියන ලද කුලකවල n(A) සහ n(B) සොයන්න